# ලංසු කැඳවීමයි

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## ආරක්ෂක අමාත්‍යාංශය

**මහල් 15 කින් යුත් වෛද්‍ය පහසුකම් හා සෙසුනිල නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතියේ වැඩ අත්තිවාරම ඉදිකිරීමේ සේවාව - යුද්ධ හමුදා රෝහල නාරාහේන්පිට. කොන්ත්‍රාත් අංකය SLA/04/2017**

1. මහල් 15 කින් යුත් වෛද්‍ය පහසුකම් හා සෙසුනිල නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතියේ වැඩ අත්තිවාරම ඉදිකිරීමේ සේවාව - යුද්ධ හමුදා රෝහල නාරාහේන්පිට සඳහා යෝග්‍ය සහ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන් ආරක්ෂක අමාත්‍යාංශය වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. සේවාවේ ඇස්තමේන්තුගත වටිනාකම රුපියල් මිලියන. 158 (වැට් බදු රහිත)කි

ගිවිසුම අත්සන් කරන දිනයේ සිට මෙම සේවාවේ කොන්ත්‍රාත් කාල සීමාව කැලැන්ඩර් දින 180 කි.

2. ජාතික තරගකාරී ලංසු තැබීමේ පටිපාටිය භාවිතා කරමින් ලංසු තැබීම සිදුකල යුතු අතර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි අර්ථ නිරූපණය කර ඇති පරිදි පහත සුදුසුකම් ලත් සියළු ලංසුකරුවන් සඳහා විවෘත වේ.

**CIDA/ICTAD ලියාපදිංචි**
**Specialty :- Bored Cast Insitu Piles**
**Grade :- GP-B1**

3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීම පිණිස සාර්ථක ලංසුකරු ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූලව ලියාපදිංචි සමාගමක් විය යුතු අතර, අසාධු ලේඛනගත කොට නොතිබිය යුතුවේ.

4. කොන්ත්‍රාත්තුව පිළිබඳව උනන්දුවක් දක්වන ඉහත සුදුසුකම් සපුරා ඇති ලංසුකරුවන්ට ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ, ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය (දකුණු පර්යන්තය) ගාලු මුවදොර ටෙරසය, කොළඹ 03 (දුර. 011-2302571) ඇමතීමෙන් වැඩි විස්තර ලබාගත හැක.

5. ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කර ඇති සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලය මිලදී ගැනීමට හැකි අතර, මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන ශාඛාවේ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීම සහ ආපසු ගෙවනු නොලබන ශ්‍රී ලංකා රුපියල් විසි දහසක් (රු: 20,000.00) ගාස්තුවක් ගෙවීම මගින් 2017.07.31 දින සිට 2017.08.21 දින දක්වා ලංසු ලේඛන මිලදී ගත හැක. ලංසු ලේඛණ මිලදී ගැනීමේදී ගෙවීම් ක්‍රමවේදය වනුයේ මුදල් පමණි.

6. සියළුම ලංසු කරුවන්ට සහභාගි විය හැකි පූර්ව ලංසුකරණ රුස්වීමක් යුද්ධ හමුදා රෝහල - නාරාහේන්පිට දී 2017.08.10 වන දින 1000 පැයට පැවැත්වෙනු ඇත.

7. ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනය 2017.08.22 දින 1000 පැය වන අතර ඊට පෙර ලංසු කොළඹ 03 බාලදක්ෂ මාවත, අංක 15/5, හි පිහිටි ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී වෙත භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු සහ විද්‍යුත් තැපැල් මගින් එවනු ලබන ලංසු පිළිනොගන්නා අතර, ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. සියළු ලංසු සමග ශ්‍රී ලංකා රුපියල් පහළොස් ලක්ෂයක (රු: 1,500,000/=) වටිනාකමින් යුතු ලංසු ලේඛනයේ සපයා ඇති ආකෘතියට අනුව හා එහි සඳහන් උපදෙස් පරිදි මහ බැංකුවේ ලියාපදිංචි මූල්‍ය බැංකුවක ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය. එම ලංසු ඇපකරයෙහි වලංගු කාලසීමාව 2017 දෙසැම්බර් මස 20 දින දක්වා විය යුතුය.

9. ලංසු වලංගු කාලසීමාව 2017 නොවැම්බර් මස 22 දින ලෙස සඳහන් විය යුතුවේ.

10. ලංසු ඉදිරිපත් කිරීම සඳහා වන අවසන් කාලසීමාව ඉක්මවූ වහාම කොළඹ 03 බාලදක්ෂ මාවත, අංක 15/5, හි පිහිටි ආරක්ෂක අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලයෙහි පැමිණෙන ලංසුකරුවන්ගේ අවසරලත් නියෝජිතයා ඉදිරියේ ලංසු විවෘත කරනු ඇත.

**සභාපති**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව**
**ආරක්ෂක අමාත්‍යාංශය**
**15/5, බාලදක්ෂ මාවත**
**කොළඹ 03**

දිනය.2017 ජූලි මස 30